**අංක 119 (4) දරණ ස්ථාවර නියෝග පරිදි රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ නිරීක්ෂණ හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.**

පාර්ලිමේන්තු ග්‍රන්ථමාලා අංකය : 114
ආයතනයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

| 2017 වර්ෂය සඳහා මූල්‍ය හා කාර්යසාධන ඇගයීමේදී හඳුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය |
|---|---|
| **01.** විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා 2018.08.28 දින වන විට පිළිතුරු ඉදිරිපත් කර ඇත. |
| **02.**අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | සියළු අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2019.01.10 දින වන විට පිළිතුරු සපයා ඇත. |
| **03.** සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික් කාර්යාල 20ක් පැවතීම හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුවී ඇත. 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කර ඇත. |
| **04.**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර අදාළ නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |
| **05.** නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේ සියළුම මාසික බැංකු සැසඳුම් වාර්තා නියමිත දිනට පිළියෙල කර ඇත. |
| **06.** අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | කාලීන මාතෘකා පිළිබඳව රජය විසින් පවරන ලද ප්‍රචාරණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සිදුවීම හා අත්‍යාවශ්‍ය සැපයීම් සේවා හා යන්ත්‍ර හා වාහන අලුත්වැඩියා ඇතිවීම හේතුවෙන් මෙම බැඳීම් ඇතිකර ගැනීමට සිදුවිය. එබැවින් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන ඇත. |
| **07.** වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය පැවතුණි. | රු:181,955 ක් වටිනා ණය ශේෂ 2ක් 2018 වර්ෂයේදී පියවා ඇත. නීතිපති උපදෙස් අනුව රු:66,232 ක් වටිනා ණය ශේෂ 2ක් කපාහැරීම සඳහා කටයුතු කර ඇත. රු:195,040 ක් වටිනා ණය ශේෂ පිළිබඳ අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |
| **08.** පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු:329,280 ක් වටිනා ශේෂ 2ක් 2019.05.07 දින වනවිට නිදහස් කර ඇත. ඉතිරි ශේෂයන් නිදහස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | |
|---|---|
| **09.**මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යන්හි ස්වභාවය අනුව එම කටයුතු ඉටු කිරීමේදී වාර්තා චිත්‍රපට නිපදවීම ආදී සමහර කාර්යන් සඳහා තරමක කාලයක් ගතවන අතර එම කටයුතු නිමවන තෙක් ලබාගත් අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් ඇතිවේ. තවද සිදුකරමින් පවතින කටයුතු නිම කිරීමට පෙර තවත් එවැනිම කාර්යක් හෝ කාර්යන් කිහිපයක් ඇරඹීමට සිදුවීම වැනි ප්‍රායෝගික හා පරිපාලන හේතුන් මත ලබාගත් අත්තිකාරමක් පියවීමට පෙර තවත් අත්තිකාරමක් ලබාදීම හෝ එකම දිනයකදී එකම නිලධාරියෙකුට අත්තිකාරම් කිහිපයක් ලබාදීමට සිදුවී ඇත. බොහෝ අවස්ථාවන්හිදී කාර්යට අදාල වියදම් නිමවූ වහාම ඉතිරි මුදල් පියවීම සිදුකරන අතර වාර්තා චිත්‍රපට නිපදවීම වැනි කාර්යන්හිදී සංස්කරණය වැනි කාර්යන් නිමකර අවසාන නිෂ්පාදනය එළිදැක්වීමට අමතර කාලයක්ද ගතවන බැවින් බිල්පත් ගොනුකර අත්තිකාරම් පියවීමේ වවුචර්පත් ඉදිරිපත් කිරීමට තරමක් ප්‍රමාද වේ.තවද නිරතුරුවම අත්තිකාරම් ලේඛන පරීක්ෂාකරමින් නොපියවූ අත්තිකාරම් පියවන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරමින් මෙවන් තත්වයන් වලක්වා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. |
| **10.** මු.රෙ.371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අත්‍යවශ්‍ය රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් මෙම අතුරු අග්‍රිම නිකුත්කර ඇත. 2019 වර්ෂයේ සිට නියමිත අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව අත්තිකාරම් නිකුත්කිරීමට කටයුතු කරනු ලැබේ. |